# 8 ශ්‍රේණිය - 03 වන වාරය

# නර්තනය හදාරන සිසුන්ට ඉගෙනුම් අත්වැලක්



අධ්‍යාපන අමාත්‍යාංශය

සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව

උපදේශණය - අධ්‍යාපන ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

- රාජ්‍ය ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය

මග පෙන්වීම - එච්.යු. ප්‍රේමතිලක මයා (අතිරේක ලේකම්, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)

- නීල් ගුණදාස මයා (අතිරේක ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ)

සම්බන්ධීකරණය - ආචාර්ය නිශාද් හඳුන්පතිරණ මයා (අධ්‍යාපන අධ්‍යක්ෂ වැ.බ.)

නියාමනය - මහීපාල උක්වත්ත මයා (නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව)

**පාඩම් සැකසීම -**

- ආචාර්ය පාලිකා සමන්ති මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - විදේශ නර්තන අධ්‍යයන අංශය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය -කොළඹ
- මරීනා ද සොයිසා මිය - කථිකාචාර්ය - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම
- දීපමාල් විජේතුංග මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - අනුරාධපුරය
- සුගත් කරුණානායක මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ
- දුමින්ද සේනානායක මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කාර්යාලය - හෝමාගම
- හිමාලි ගමගේ මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය -මහනුවර
- කේ .එල් .ඒ .ධර්මලතා මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය දෙහිඹිට
- අනෝමා කහදවආරච්චි මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය කැළණිය

8 ශ්‍රේණිය නර්තන විෂයට අදාලව , තෙවන වාරයට නියමිත"ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය හැර වෙනත් නර්තන සම්ප්‍රදායයන්ට අයත් ශාන්ති කර්ම (කොහොඹා කංකාරිය, දෙවොල්මඩුව, පහන් මඩුව) හඳුනා ගනිමු" පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත.

හොඳින් කියවා ,අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න.

- **ඔබ පාසලේ ඉගෙන ගනු ලබන්නේ උඩරට සම්ප්‍රදාය නම් පහතරට සම්ප්‍රදායයේ දෙවොල් මඩුවද, සබරගමු සම්ප්‍රදායේ පහන් මඩුවද ඉගෙන ගන්න.**
- **ඔබ ඉගෙන ගන්නේ පහතරට සම්ප්‍රදාය නම් කොහොඹා කංකාරි ශාන්ති කර්මයත් සබරගමු පහන් මඩුවත් අධ්‍යයනය කරන්න.**
- **සබරගමු සම්ප්‍රදාය ඉගෙන ගන්නේ නම් කොහොඹා කංකාරියත්, දෙවොල් මඩුවත් අධ්‍යයනය කරන්න.**

## ශාන්තිකර්ම

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයෙකුට ඇතිවූ මානසික සුභ සිද්ධිය සඳහා දෙවියන්, යකුන්, ග්‍රහයන් වෙනුවෙන් ඇතිවන බලවේග දුරුකර ගැනිමට යොදා ගන්නා කිසියම් සුභ කාර්යයකි. සෙතක් ශාන්තියක් වෙනුවෙන් මිනිසුන්ගේ සිත්තුළ ඇතිවන සුවපත් බව ශාන්ති කර්ම තුළින් ඉටුවේ.

දේශීය නර්තන සම්ප්‍රදායන් 3 වෙනුවෙන් ශාන්තිකර්ම පැවැත්වේ. ඒ අතර

- උඩරට නර්තන සම්ප්‍රදාය - කොහොඹා කංකාරිය ශාන්තිකර්මය.
- පහතරට නර්තන සම්ප්‍රදාය - දෙවොල් මඩුව ශාන්තිකර්මය.
- සබරගමු නර්තන සම්ප්‍රදාය - පහන් මඩුව ශාන්තිකර්මය.

ශාන්තිකර්ම පැවැත්විමේ අරමුණු ඒ ඒ සම්ප්‍රදායට අනුව වෙනස් වේ.

| ශාන්තිකර්මය | අතීතයේ පැවැත්වීමට හේතු | වර්තමානයේ පැවැත්විමට හේතු |
|---|---|---|
| කොහොඹා කංකාරිය | පඩුවස්දෙව් රජුට වැළඳුනු දිවිදෝසය නිසා හටගත් රෝගය සුවපත්ව කිරිමට. | භව භෝග සම්පත් වැඩි දියුණු කිරිමට, රෝගාබාධයන් සුව කර ගැනිමට, ගමට, රටට. සෙත් ශාන්තිය සඳහා හා අධ්‍යාපන අවශ්‍යතාවන් වෙනුවෙන්. |
| දෙවොල් මඩුව | සේරමාන් රජුට ඇතිවූ හිසරදය සුව කිරිමට. | සශ්‍රීකත්වය උදෙසා, ගමට, රටට සෙත් පතා,රෝග නිවාරණයට, අධ්‍යාපනික අවශ්‍යතතා සඳහා. |
| පහන් මඩුව | සේරමාන් රජුට ඇතිවූ හිසරදය සුව කිරිමට. | පත්තිනි මෑණියන්ගේ ලෙඩ ලෙස ගැමියන් හඳුන්වන රෝගවලිවලින් මිදිමට, ගමට, රටට. සෙත් පැතිමට, භව භෝග සම්පත් දියුණු කිරිමට හා අධ්‍යාපනික අවශ්‍යතා සඳහා. |

මෙම ශාන්තිකර්ම සඳහා වෙන වෙනම පුරාවෘත්ත කථා ඇත. ඒ අතර

**කොහොඹා කංකාරිය ශාන්ති කර්මය ,**

- විජය කුවේණි කතාවේ ඔවුනට ජීවහත්ත, දිසාලා නම් දරුවන් දෙදෙනකි. විජය රජු කුවේණි අතහැර ගිය අවස්ථාවේ කෝපයට පත් කුවේණි රජුට ශාප කළහ. විජය රජු ගේ ඇවෑමෙන් රට පාලනය කල පඩුවස්දෙව් රජුට ඒ ශාපය වැදිණි. එහිදි පඩුවස්දෙව් රජුට සිහිනයෙන් දිව් වෙසක් දැක බියපත් වී රෝගාතුරව කොහොඹා කංකාරිය ශාන්ති කර්මය කළහ. ඒ සඳහා ශක්‍ර දේවේන්ද්‍රයා මානෙල් මලින් උපන් කෙනෙකු සොයා යාගයක් කළ හොත් සුවවන බව පැවසීය. මේ සඳහා රාහු අසුරේන්ද්‍රයා හට ඌරු අවතාරයක් ලබා දී මලය රටට ගොස් මලය රජුගේ නන්දන උයන පාළු කර, ඒ බව සැලවුණු රජු දුනු හී ගෙන ඌරා ඇල්ලීමට ගිය අවස්ථාවේ ඌරා ලුහුබැඳ ලක්දිවට පැමිණියහ. එහිදි හන්තානා කන්දට ආ ඌරා කන්ද අසලදි ගලක් බවට පත් විය. එතැන අසලට ආ සක් දෙව් රජු එතුමා ගෙන්වූ හේතුව විස්තර කළහ. ඉන්පසු මලය රජු ඇතුළු පිරිස අනුරාධපුරයේ මහමෙවුනා උයනේ නියමිත දිග, පළල සහිත මණ්ඩපයක් සාදා ශාන්ති කර්මය කිරිමෙන් අනතුරුව දිව් දෝෂය සුවපත් වී ඇත.

**දෙවොල් මඩුව / පහන් මඩුව**

- සේරමාන් රජුගේ උයන පාළු කරමින් සිටි ගෝනෙකු මරා දමන ලෙස රජු අණ කරන ලදින් හේවායින් ගෝනා පසුපස එළවීමේදි ගෝනාගේ පය පැටලී අසල පොකුණට වැටිමෙන් පසු මරණයට පත් විය. රජු තමාට කළ විපත දැනගත් රජුගෙන් පළිගැනිමට පොකුණේ මලක කුඩා මැඩියෙක්ව ඉපිද රජු මල ආඝ්‍රණය කිරිමේදි නාසයට ගියේය. ඉන් හට ගත් හිසරදය සුව නොවිම නිසා ,දිනක් රජුට හීනෙන් රූමත් කාන්තාවක් දැකිම නිසා මේ බව පුරෝහිතට දැන්විමෙන් පසු ඒ පෙනී ඇත්තේ පත්තනි දේවිය බවත්, බෞද්ධාගම ස්ථාපිත රටකට ගොස් පින් පැමිණියහොත් රෝගය සුව වන බව පැවසිය. එහිදි ලංකාව තෝරා ගෙන කැළණියට ගොස් බුදුන් වැඳ දෙවියන්ට පිං දී රුවන්වැල්ලේ දී දෙවොල් මඩුව ආරම්භ කළ බව කියැවේ.

| | කොහොඹා කංකාරිය | දෙවොල් මඩුව | පහන්මඩුව |
|---|---|---|---|
| පුද ලබන දෙවිවරු | ඉරුගල් බණ්ඩාර<br>කන්දේබණ්ඩාර<br>කොහොඹදෙවි 3 කට්ටුව<br>උඩුවිරිය බණ්ඩාර<br>වීරමුණ්ඩ දෙවි | පත්තිනි දේවිය<br>දෙවොල්<br>වාහල<br>දොළහ දෙවියෝ | පත්තිනි,කතරගම,විෂ්ණු, සමන්,ඇඩිමුණ්ඩ, වාහල,දෙවොල් |
| චාරිත්‍ර විධි | කප්සිටුවීම,මඩුපේකිරිම, තොටපේකිරිම.මලපේ කිරිම,ආභරණ වැඩමවීම මගුල් බෙර වාදනය.මඩුව සැදිම,මුරුතැන් පිසිම,නානුමුර මංගල්‍යය, කඩවර ගොටු දීම | තොටමෙට යාම, මිල්ල කැපීම, බිසෝකප සිටුවිම, කාලපන්දම් පූජාව, තොරන්යාගය, කිරි ඉතිරවීම. | කප්සිටුවීම, මඩුපේකිරිම, තොටමෙටයාම. මලපේ කිරිම, ආභරණ වැඩමවීම මිල්ලගස පේකිරිම, හළඹවැඩමවීම, ගිනිපෑගීම, උපත් කවි ගායනය |
| නර්තන අංග ගායනය සහිත/රහිත | අස්නේ, මඩුපුරය, කොහොඹ හැල්ල, දාන 5, කතා5, යක් ඇනුම, දුනුමාලප්පුව, කෝල්පාඩුව, හත් පදය. | තෙල්මේ, දෙවොල්, වාහල, පත්තිනි, දොලහ පෙළපාලිය | දේව කෝල්පාඩුව, යහන් දැක්ම, පන්දම් පද, මුදුන් තාලය, හත්පද පෙළපාලි, මල්පද නැටිම |

| | | | |
|---|---|---|---|
| නාට්‍යමය අවස්ථා | යක්කම්, මුවමල විදිම, ගුරුගේ මාලාව, මාරාව, ගබඩා කොල්ලය | අඹවිදමන,මරා ඉපදවීම, ගරා නැටීම | අඹවිදමන, අසුරයක්කම, දෙවොල් ගොඩ බැසිම, රාමාමැරීම. පොක්කඩේ පාලිය. |
| වාදන අවස්ථා | මගුල්බෙර, අත්‍යාබෙර, යක්තුං පදය | මගුල්බෙර, දැකුම් අත් පිං බෙර | මංගල දවුල් වාදනය |

උඩරට නර්තන සම්ප්‍රදායේ කෝෂ්ඨාගාරය ලෙස හැදින්වෙන කොහොඹා කංකාරිය යක්දෙස්සන් විසින් පළඳිනු ලබන සාම්ප්‍රදායික ඇදුම් කට්ටලය වන්නේ වෙස් අදුම් කට්ටලයයි.

- ජටාව
- ජටා පටි
- පායිම්පත
- වෙස්තට්ටුව
- නෙත්ති මාලය
- තෝඩු පත්
- කෙමෙත්ත
- අවුල් හැරය
- උරබාහු
- බන්දි වළලු
- හගල
- හගල ලනුව
- දෙවල්ල
- පොත් පොට
- උල්උඩය
- ඉණ හැඩය
- මේස් කලිසම
- සිලම්බු



වෙස් ඇදුම් පැළඳි නර්තන ශිල්පීන් හා ඇදුම් පැළඳුම් හොදින් අධ්‍යයනය කරන්න

දෙවොල් මඩු ශාන්ති කර්මයේ සුවිශේෂ රංග වස්ත්‍රභරණ කට්ටල ගණනාවකි.එක් එක් නර්තන අංග සඳහා ද වෙන් වෙන් වශයෙන් ඇඳුම් කට්ටල ඇත. ඒ අතර

| තෙල්මේ ඇඳුම් කට්ටලය. | දෙවොල් ඇඳුම් කට්ටලය | බෙර ඇඳුම් කට්ටලය |
|---|---|---|
| ➢ සේලය | ➢ ඉණ හැඩය | ➢ ඉනට ඔතන රෙද්ද(සුදු) |
| ➢ පච්චවඩම | ➢ පච්චවඩම | ➢ පච්ච වඩම |
| ➢ ලනුව | ➢ රැලිසාය | ➢ බන්ධි වළලු |
| ➢ ඉණරැල්ල | ➢ දෙවොල්හැට්ටය | ➢ ගිගිරි වළල්ල(දකුණු අතට) |
| ➢ පබළු ඉණ හැඩය | ➢ දෙවොල් තොප්පිය | ➢ කර පටිය |
| ➢ පබළු කර මාලය | ➢ සේලය | ➢ ජටාව |
| ➢ අත්පටි | ➢ කාගුල් කුට්ටම | ➢ කඩුක්කන් |
| ➢ ජටා රෙද්ද | ➢ මේස් කලිසම | ➢ බන්ධිවළලු |
| ➢ නළල් පටිය | ➢ සිලම්බු | |
| ➢ පබළු රැල්ල | | |
| ➢ මේස් කලිසම | | |
| ➢ සිලම්බු, රහු | | |



තෙල්මෙ නර්තනයක්



දෙවොල් නර්තනයක්

- ඉහත ඡායාරූපවල ඇඳුම් පැළඳුම් හොඳින් අධ්‍යයනය කරන්න

සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටල  පබළු ඇඳුම් කට්ටලය හා දෙවොල් ඇඳුම් කට්ටලය ලෙස හඳුන්වයි.





| **පබළු ඇඳුම් කට්ටලය** | **දෙවොල් ඇඳුම් කට්ටලය** |
|---|---|
| සේලය | සේලය |
| රතු රෙද්ද | දෙවොල් හැට්ටය |
| අත් පොට හතර | රතු රෙද්ද |
| ඉණ වෙළුම් පටිය | ඉණ රැල්ල |
| ඉණ හැඩය | උරමාල රෙද්ද |
| හැඩ කැල්ල | කාගුල |
| පබළු හැට්ටය | ඉණ වෙළුම් පටිය |
| කර පටිය | කකුල් පටි |
| බන්ධි වළලු | සුදු මාලය |
| කඩුක්කන් | සුදු මේස් කලිසම |
| ජටාව | |
| නෙත්ති මාලය | |
| සුදු මේස් කලිසම | |
| රහු කුට්ටම | |

මෙම ශාන්ති කර්ම වල විවිධ සැරසිලි ඇත. එක් එක් ශාන්ති කර්මයෙන් ශාන්තිකර්මයට වෙනස් වේ. එහෙත් සැරසිලි සැකසීම සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය පරිසරයෙන් ලබා ගන්නා ගොප් කොළ, කෙසෙල් බඩ, කෙසෙල් පතුරු, ඉරටු කෝටු, හබරල කොළ, පුවක් පටි, පස් වලු ආදිය නම් කළ හැක. තවද මේ සඳහා භාවිත රංග උපකරණද, භාණ්ඩ ද, ඇත.ඒ අතර ප්‍රධාන සැරසිලි පහත වගුවේ ඇත.

| **කොහොඹා කංකාරිය** | **දෙවොල් මඩුව** | **පහන් මඩුව** |
|---|---|---|
| කංකාරි මඩුව | දෙවොල් මඩුව | **පත්තිනි තොරණ** |
| අයිලය | තොරණ | **බිසෝකප** |
| යහන | බිසෝකප | මල් යහන |

රංග උපකරණ ලෙස,

කොහොඹා කංකාරියේදි හත් පදය සඳහා භාවිතා කරන පුජා භාණ්ඩ,පොල් මල්,දුන්න,ඊතලය,කෙසෙල් බඩෙන් සාදා ගන්නා ඌරා,කෝලායුධය,පැඟිදුම් පෙට්ටිය ඉන් ප්‍රධාන වේ. දෙවොල් මඩුවේද,හත්පද පෙළපාලියට අයත් පූජා භාණ්ඩ, හළඹ, පන්දම්, පොල් මල් ආදියත් වේ. පහන් මඩුවේදි ද හත් පෙළපාලිය සඳහා භාවිතාවන පූජා භාණ්ඩත්, හළඹ, දුන්න, ඊතලය යන උපකරණත් ඇත.

ඇගයිම. 1. සම්ප්‍රදායන් 3 ට අයත් ශාන්ති කර්ම හඳුන්වන්න.

2. එක් එක් ශාන්ති කර්මයන් අතීතයේ පැවැත්වීමට හේතු ලියා දක්වන්න

3. කොහොඹා කංකාරියේ,දෙවොල් මඩුව,පහන් මඩුවේ ඇති නර්තන අංග ලියා දක්වන්න.

4. ශාන්ති කර්මවල ඇති ප්‍රධාන සැරසිලි ලියා දක්වන්න.

5. ඒ ඒ ශාන්ති කර්ම සඳහා භාවිතාවන වාද්‍ය භාණ්ඩ රූප සටහන් මගින් ඇඳ දක්වන්න.

6. ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටුවල ඇති නැට්ටුවන්ගේ නර්තන රූප බලා අදාල නර්තන සම්ප්‍රදායන් අධ්‍යයනය කරන්න.

8 ශ්‍රේණිය නර්තන විෂයට අදාලව , තෙවන වාරයට නියමිත" **ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායකවූ ශිල්පීන්** "පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත. හොදින් කියවා අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න.

## ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායකවූ ශිල්පීන්

### එස්.පණිභාරත මහතා



- සතර කෝරලේ අල්ගම ග්‍රාමයේ 1920 පෙබරවාරි 24 දින උපත ලැබූ මෙතුමාගේ මුල් නම වූයේ පාණිස්ය.
- මෙතුමාට වැඩිමහල් සොහොයුරියන් 3ක්ද,බාල සහෝදරයන් 3ක්ද,එක් බාලසොහොයුරික්ද විය.ඇය චිත්‍රා අල්ගම නමින් හැදින්වූ නර්තන ගුරුවරියකි.
- මෙතුමාගේ පියා පබානිස් මහතාට අවශ්‍ය වූයේ තම මේ පුතාට වෙද කම ඉගැන්වීමයි. මොහුගේ බාප්පා වන අල්ගම කිරිගණිත ගුරුන්නාසේගේ නර්තනයන් දැක මෙතුමා නර්තන කලාවට යොමු විය.
- තම සීයාගෙන් හා බාප්පා ගෙන් නර්තනය හදාරා ඇති අතර, දවුල් හා තම්මැට්ටම් වාදනය පුංචි කිරා නම් ඥාතියකුගෙන් ඉගෙන ඇත.
- උඩරට,පහතරට ,සබරගමු යන නර්තන අවස්ථාවන් සදහාත් මෙතුමා දක්ෂතා පෙන්වූ අයෙකි.
- ප්‍රථම වෙස් බැදි කාන්තව වන චන්ද්‍රෙල්කා පෙරේරා මහත්මියගේ නර්තනයට බෙර වාදනය කර ඇත.
- 1944 ශිෂ්‍යත්වයක් ලැබ ඉන්දියාවේ ශාන්ති නිකේතනයට ගිය මෙතුමා කතකලි,මනිපුරි ඇතුළු නර්තනාංගත්,මෘදංගය,පක්වාජ් හා කෝල් යන වාද්‍ය භාණ්ඩ වාදනයත් හදාරා ඇත.
- රබීන්ද්‍රිනාත් තාගෝර්තුමාගේ ගීත නාට්‍ය වල රඟපෑ මෙතුමා ප්‍රශංසාවට පමණක් නොව ලංකාවට පැමිණි පසු පණිභාරත යන නාමය ගෞරවය පිණිස පිදුම් ලැබුහ.
- ගුරුවරයකු ලෙස සේවයට ඇතුල් වූ පණිභාරත මහතා මීරිගම ගුරු විදුහලේ කථිකාචාර්යය ධුරයත්, 1952 රජයේ ලලිත කලායතනයේ ප්‍රථම විදුහල්පතිවරයා ලෙසත් පත්විය.
- කැලණි විශ්ව විද්‍යාලයේ සෞන්දර්යය අධ්‍යයන ආයතනයේ නර්තන අංශයේ අංශ ප්‍රධාන ලෙසත්, වසර 31 වඩා වැඩි කාලයත් සේවය කල මෙතුමාට 1991 දි කැලණිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය විසින් ආචාර්යය උපාධියද පිරි නමා ඇත.

- පණිභාරතයන්ගේ කලා ප්‍රබෝධය ඉහළ නැංවීමට ඔහු කළ සේවාවන් අතර 1953 ගොයම් කැපීමේ නැටුමත්,නාරිලතා,මොනර හා දඬයක්කාරයන්ගේ නැටුම ආදි නිර්මාණ කරන ලදි.
- මුද්‍රා නාට්‍ය කලාවටද දායකත්වය දෙමින් කෝච්චිය,පොරපොල් පිටිය,ග්‍රහ අපලය,ගම්මානේ මල් පිපිලා හා බතේ උපත යන නිර්මාණ බිහි කරමින් දායකත්වය දැක්වූ අතර, සිකුරු තරුව, කුරුළු බැද්ද, අශෝකා වැනි චිත්‍රපටි සඳහාද නර්තන නිර්මාණ එකතු කරමින් කලාවට සුවිශේෂ දායකත්වයක් ලබා දී ඇත.
- ශ්‍රී ලංකාවේ නර්තන කලාව ඉහළ නැංවීමට දායකත්වය ලබා දුන් පණිභාරතයන් දියණියන් දෙදෙනෙකුගේ හා එක් පුතෙකුගේ පියෙක් විය.
- ලෝකයේ බොහෝ රටවලට ගොස් ලංකාවට ලබා දුන් කීර්තිය අපමණය.

## කේ.එස්. ප්‍රනාන්දු ගුරුතුමා.



- ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ග්‍රාමයේ ලෝකන් වත්තේ 1920 පෙබරවාරි 20 උපත ලැබූ කේ.එස්.ප්‍රනාන්දු මහතා පහතරට නර්තන කලාවේ ප්‍රවීණත්වයක් ලැබූ කලාකරුවෙකි.
- මෙතුමා නර්තන,ගායන,වාදන,බලි ඇඹීම,චිත්‍ර කලාව හා කැටයම් කලාවද දක්ෂ විය.
- පහතරට නර්තන ආචාර්යවරයකු ලෙස රජයේ සේවයට පත්විමෙන් පසුව රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විදුහලේ උපදේශක ලෙසත් සේවය කර ඇත.
- මෙතුමාගේ දක්ෂතාවයෙන් පහතරට නර්තන කලාව විශ්ව විද්‍යාල මට්ටමට ගෙන ඒමට කටයුතු කල ශිල්පියෙකි.
- යක්,තොවිල් පිළිබඳව මෙන්ම බලියාග සඳහාද හසළ දැනුමක් ලබා සිටි එතුමා බෙන්තර ශෛලියේ ප්‍රධාන යක් තොවිලයක් වන "සන්නියකුම"ශාන්ති කර්මය පිළිබඳව කෘතියක් ලියා ඇත. එය හඳුන්වන්නේ "සන්නි යකුම හෙවත් දහඅට සන්නිය" ලෙසයි.
- ශාන්ති කර්මවලට පමණක් සීමා වි ඇති පහතරට නර්තන ප්‍රසංග වේදිකාවට ගෙන ඒමේ ගෞරවය එතුමාට හිමි වන අතර, එකි නර්තන ලෙස

  ගිරිදේවි නැටුම
  සළු පාලිය
  සුරඹා වල්ලිය
  නාරිලතා
  රතිරාග වන්නම යන නර්තනාංග පෙන්වා දිය හැක.
- නර්තනයට පමණක් නොව නාට්‍යවල රංගන ක්‍රම සකස් කිරිමද ඔහු අතින් සිදුවූ තවත් මෙහෙවරකි. ජන වේගය,මිණි සළඹ,මා හේනේ රීරි යකා,මල කෝලම් යන නාට්‍ය මෙයට උදා: වේ.

- මෙතුමා අතින් සිදුවූ නිර්මාණ ප්‍රසංගයක් ලෙස හෙළ රසාංග හැදින්විය හැක.
- තවද රංවස්ත්‍රාභරණ සකස් කිරීමද මෙතුමා අතින් සිදුවූ තවත් සුවිශේෂ කාර්යකි.
- එස්.පණිභාරත,චිත්‍රසේන ඩයස්,නිත්තවෙල ගුණයා යන ශිල්පීන් සමඟ විදේශීය සංචාර ගණනාවකටම සහභාගි වී ඇත.
- ඉතාලිය, එංගලන්තය, ප්‍රංශය ,ඇමරිකාව යන රටවල්වලද සංචාරය කර ඇත.
- පහතරට නර්තන කලාව වර්තමාන තත්වයට ගෙන ඒමටත්,පාසැල් පද්ධතියට සුදුසු පරිදි නර්තනාංග සැකසීමටත් එතුමා දැරූ උත්සහය සාර්ථක වී තිබීම සතුටට කරුණකි.

## ඩී.වී.හීන් නිළමේ ගුරුතුමා.

- රත්නපුර හිදැල්ලන ගලුකාගම ප්‍රදේශයේ 1914 මාර්තු 14 උපත ලැබූ මෙම කලාකරුවා හීන් නිළමේ නම් විය.
- සබරගමු නර්තනයට මෙන්ම එහි ගායන, වාදනය සඳහාත් සුවිශේෂ දක්ෂතා දක්වා ඇති අයෙකි.
- සබරගමු පහන් මඩුව,කිරි මඩුව හා නවග්‍රහ බලි ශාන්තිකර්ම පිළබඳ සුවිශේෂ හැකියාවක් දක්වන මෙතුමා දේව ස්තෝත්‍ර හා යක්ෂ ස්තෝත්‍ර ගායනයට දක්ෂතා දැක්වූ අයෙකි.
- **ශාන්ති කර්ම සඳහාද කටයුතු කළ මෙතුමා යන්ත්‍ර ,මන්ත්‍ර,ගුරුකම් ආදි කටයුතුද කළහ.**
- **සමන් දේවාල පෙරහැර සම්බන්ධවද කටයුතු** කළ හීන් නිළමේ ගුරුතුමා එහි නැටුම් කණ්ඩායම් භාරව රාජකාරි කටයුතු කළ අයෙකි. දේවාභරණ වඩම්මන අවස්ථාවේදි වසර ගණනාවක්ම මංගල දවුල් වාදනයද කර ඇත.
- සාම්ප්‍රදායික සබරගමු නර්තන කලාව බාල පරම්පරාවට දීමට ඔහුට තිබූ උනන්දුව එම බාල ශිල්පීන්ගෙන් පෙනේ. ඒ අතර රද්දැල්ලේ (පරංගියාවත්තේ) පොඩි මහත්තයා , කේ.පීටර් බුදනාවල, ජී.වී.පුංචි නිළමේ යන අය ඉන් සුවිශේෂ වේ.
- සබරගමු නර්තන කලාවේ සුවිශේෂතා හදුනාගෙන තම දරුවන්ටත් නර්තනයට කියා දෙමින් එම සම්ප්‍රදාය දියුණු කිරීම උපරිමයෙන් සේවාවක් කළ පාරම්පරික ඇදුරුතුමෙකි.

**<u>8 ශ්‍රේණිය  නර්තන විෂයට අදාලව ,තෙවන වාරයට නියමිත"</u> මහනුවර දළදා පෙරහැර හා එහි අසිරිය. <u>" පාඩමට අදාලව විෂයය කරුණු  මෙහි ඇතුළත් කර ඇත . හොදින් කියවා ,අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න.</u>**

## <u>මහනුවර දළදා පෙරහැර  හා එහි අසිරිය.</u>

ලංකාවාසි බෞද්ධාගමිකයන්ගේ මුදුන් මල්කඩ ලෙස පිළිගැනෙන දළදා වහන්සේ සකල ලෝක වාසීන්ගේ වන්දනාමානයට පාත්‍ර වූ අති පූජනීය වස්තුවකි.

අතීතයේ දන්ත හේමමාලා කුමරු වඩම්මන ලද මෙම දාතුන් වහන්සේ රජවරුන්ගේ රාජ්‍ය උරුමයට ප්‍රධාන ලෙස බලපෑ සංකේතයක් ලෙසද දළදා වහන්සේ හදුන්වයි. ඉංග්‍රීසි,ලන්දේසි වැනි විදේශිකයන්ගේ පැමිණි කාලවලදී පරසතුරු කරදරවලට මුහුණ දුන්නත් රජවරු තම ජීවිතය පරදුවට තබා දළදාව රැක ගත්හ. විවධ ස්ථානවලට රැගෙන ගිය දළදා වහන්සේ සතුරන්ගෙන් ආරක්ෂා කරමින් දළදා මන්දිර තනා දළදාව තැන්පත්කොට විවිධ පූජෝපහාර පැවැත්වූහ.



මේ අතර පොළොන්නරුවේ රජ කල මහා පාක්‍රමබාහු රජු අති උත්කර්ෂවත්  අන්දමින් දළදා පෙරහැර පවත්වා ඇති රජවරුන්ගෙන් කෙනෙකි. තවද දඹදෙනි යුගයේ රජකළ දෙවන පරාක්‍රමබාහු රජ,නැටුම්,ගැයුම්,  වැයුම් මැද දළදා පෙරහැර පවත්වා ඇති රජ කෙනෙකි. මහනුවර යුගයේ විවිධ හේතුන් නිසා දළදාව පෙරහැර පැවැත්වීමට නොහැකිවුත් මහනුවර සතර මහා දේවාල වන විෂ්නු,නාථ.කතරගම හා පත්තිනි  පෙරහැර  නොකඩවා පැවැත්විය. කාලයක් යාමේදි නැවත දළදා පෙරහැර නැවත දේවාල සතර සමඟ සම්බන්ධ වී ඇත. ඉන් පසුව පෙරහැර  වාර්ෂිකව ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වා ඇත. මහනුවර දලදා මාළිගාව හා සතර මහා දේවාල පෙරහැර ඇසළ මාසයේ පවත්වන හෙයින් එය "ඇසළ මහ පෙරහැර" නමින් හැදින්වේ. අතීතයේ සිටම වැසි ලැබීමටත්,රටට සෞභාග්‍යය ලබා ගැනිමටත් අරමුණු කරගෙන පෙරහැර පවත්වා ඇත.
ප්‍රධානම සංස්කෘතික අංගයක් ලෙස පවත්වන  දළදා පෙරහැර ලාංකිකයන්ගේ ජාතික උත්සවයක් බවට පත් වී ඇත.

දළදා පෙරහැර පැවැත්විමේදි විශේෂ චාරිත්‍ර පවත්වනු ලබයි.නැකත් රාළ විසින් නැකත්  සාදා කප් සිටවනු ලබයි.එය මහනුවර විෂ්නු දේවාලයේ නැකතට කප සිටුවා භාර භාර වේ. මින් පසුව ඇතුල් පෙරහැර හෙවත්,බිසෝ පෙරහැර නමින් හදුන්වන  මුල් දින 5

පෙරහැර අතීතයේ රජවරු පවත්වා ඇත. එදා සිට අද දක්වාම මේ පෙරහැර චාරිත්‍රානුකූලව පවත්වයි. ඉන්පසු එළඹෙන දින පහේ පවත්වන කුඹල් පෙරහැර නරඹන්නන්හට විශ්වාසය ගෙන දෙනු ඇත. පෙරහැර නැරඹීමෙන්,ලෙඩ රෝග වලින් ආරක්ෂාවීම යන විශ්වාසය නිසා විශාල ප්‍රේක්ෂක පිරිසක් මේ පෙරහැර නැරඹීමට පැමිණේ.ඉන්පසුව පවත්වන්නේ **රන්දෝලි** පෙරහැරයි. සතර මහා දේවාල වල දෝලාවල් රැගෙන යන අයුරු දක්නට ලැබේ. දින 5 ක් පවත්වන මෙම පෙරහැර ඉතා චමත්කාරජනක වන අතර, රන්දෝලි පෙරහැර නැරඹීමට දෙස් විදෙස් බොහෝ පිරිසක් අතීතයේ සිට අද දක්වාම පැමිණේ

පංච තූර්ය වාදන මැද්දේ හස්තිරාජයා මත වඩම්මන කරඬුව හේවිසි පද මැද්දේ ,පෙරහැරේ ගමන් කරයි.



රන්දෝලි පෙරහැරේ අවසන් දවසේ ගෙවදින්නේ නැතිව පාන්දර ආදාහනා මළුවට යන පෙරහැර කරඬුව ගෙඩිගේ විහාරයේ තැන්පත් කොට ගැටඹේ තොට ළගට ගොස් දිය කපා ආපසු පැමිණ ගෙඩිගේ විහාරයේ තැන්පත් කර තැබූ දළදා වහන්සේ රැගෙන දවල් පෙරහැර ගමන් කරයි.



දළදා මාළිගාවේ තුන්වටක් පැදකුණු කොට පෙරහැර අවසන් කරනු ලබයි. පෙරහැර නිම කළ බව අතීතයේ ද රජුට දැනුම් දුන්නා සේම වර්තමානයේ ද ජනාධිපතිවරයාට එලෙසම දැනුම් දෙනු ලබයි. වර්තමානයේ දළදා වහන්සේගේ අයිතිකරු ලෙස හඳුන්වන දියවඩන නිලමේ හා සතර මහා දේවාලවල බස්නායක නිලමේවරු මහනුවර ජනාධිපති මන්දිරයට ගොස් මෙම චාරිත්‍රය කරනු ලබයි. පෙරහැර අවසන් වී පෙරහැරේ ගමන් ගත් සියලු දෙනා වෙනුවෙන් වස්දොස් දුරුවීම සඳහා විෂ්නු දේවාලයේ දින 7ක් වලියක් මංගල්‍යය පවත්වනු ලබයි.

මෙම පෙරහැර පවත්වන විට ඒ ඒ දිනවලට නියමිත සම්ප්‍රදායික ක්‍රම පවා අතීතයේ පවත්වා ඇත. ඒ අතර කසකරුවන්ගේ සිට දියවඩන නිලමේ දකවාත්,සතර මහා දේවාල පෙරහැර පැවැත්වීමත් මෙහි සුවිශේෂතා වේ. මෙහි ගමන් කරන නර්තනාංග අතර උඩරටට ආවේනික නර්තන අංග ලෙස වෙස්,උඩැක්කි,පන්තේරු,හා රබන් ,තාලම්,ලී කෙළි, චාමර, සවරන්, කඩු යන ගැමි නැටුම්ද වේ.






වාදන අතර ප්‍රමුඛ වන්නේ තම්මැට්ටම්, දවුල්, හොරණෑ වාද්‍ය භාණ්ඩයි.




ශිල්පීය දක්ෂතා පෙන්නුම් කරන වාදන ශිල්පීන් තමන්ගේ දක්ෂතා පෙන්වමින් පෙරහැරේ ගමන් කරයි. පෙරහැර අලංකාර කරන අය අතර කසකරුවන් ,ගිනිබෝල කරකවන්නන්,කොප්පරා පන්දම් කරුවන්,සේසත්,චාමර,කොඩි රැගෙන යන්නන්, හා විවිධ වර්ණයන්ගෙන් ඉතා අලංකාර සකසා ඇති වස්ත්‍ර ද පැළඳි අලි ඇතුන්ද ගමන් කරති.




මෙහි නර්තනාංග සඳහා අඳින රංග වස්ත්‍රාභරණ කට්ටල් ගණනාවකි.

පහත රූප සටහන් පිළිවෙලින් හොඳින් බලන්න,

1. වෙස් ඇඳුම් කට්ටලය
2. නෛයඩි ඇඳුම් කට්ටලය
3. උඩැක්කි,
4. පන්තේරු ඇඳුම් කට්ටලය


වෙස් නෛයඩි උඩැක්කි පන්තේරු

මෙහි සුවිශේෂ වන්නේ රන්සිවිගේ කරඬුවටත් ඇත් රජුටත් හැමෝම ගෞරව කිරීමයි.  මෙම පෙරහැරට ස්ථීර නර්තන ,වාදන ,ගායනා කණ්ඩායම් සේවය කරති.

තව ද වෙස් ඇඳුම් කට්ටලය ඇඳ ගත් නර්තන ශිල්පියෝ සහ අනෙකුත් ශිල්පීහු පිනුම් නොගසති. ඒ උතුම් දළදා වහන්සේට කරන ගෞරවයක් ලෙසිනි.
වෙස් නර්තන ශිල්පීන්, රබන්, උඩැක්කි, පන්තේරු, තාලම් ආදී හැම ශිල්පීන්ගේම ගායනා වලින් ඇහෙන්නේ **ත්‍රිවිධ රත්න ගායනාම** වීම විශේෂයකි.



අතීතයේ දී ශිල්පීන්ට ගම්වර ලබා දී ඇත.  වර්තමානයේ ඔවුන් වෙනුවෙන් ජනාධිපති සම්මාන ද ලබයි.




සැමට දළදා සමිඳු පිහිටයි!

**<u>8 ශ්‍රේණිය  නර්තන විෂයට අදාලව ,තෙවන වාරයට නියමිත ”</u>භරත නාට්‍යම් සම්ප්‍රදාය<u>“පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත . හොඳින් කියවා , අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න.</u>**

## <u>භරත නාට්‍යම් සම්ප්‍රදාය.</u>

ඉන්දියාවේ නර්තන සම්ප්‍රදායන් 7කි. එයින් ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් හතරක් සම්බන්ධයෙන් කරුණු දක්වමු.ඒ අතරින් මුලින්ම අධ්‍යයනයය කරනු ලබන්නේ ශාස්ත්‍රීය නෘත්‍යය අංගයක් වන භරත නාට්‍යම්ය. භාරතයේ නර්තන සම්ප්‍රදායන් වලින් පැරණිතම නර්තන අංගය භරත නාට්‍යම් වේ. භරත මුණිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව සැකසි ඇති භරත නාට්‍යම් දක්ෂිණ භාරතයේ මදුරාසිය, තාන්ජෝරය කේන්ද්‍ර කරගනිමින් පවතින මේ නර්තන සම්ප්‍රදාය හින්දු ආගමික ආභාෂය ලබමින් පැවතේ.










ශිව දෙවියන්  සමඟ පුද ලබන භරත නාට්‍යම් හින්දු කෝවිල් ආශ්‍රිතව පැවත ඇත. කෝවිල්වල දෙවියන් වෙනුවෙන් ඇප කැප වී සිටින කාන්තාවන් දේවදාසීන් ලෙස හඳුන්වා ඔවුන් පූජෝපාහාර පිණිස නර්තනය ඉදිරිපත් කර ඇත. එය දාසි ආට්ටම් ලෙස මුලින්ම හඳුන්වා ඇත.

මේ අතර මෙම නර්තනය පිළිබඳ කැපවීම් කළ පුද්ගලයන් අතර තන්ජාවූර් සහෝදරයන් ප්‍රධාන වේ. භරත නාට්‍යම් සම්ප්‍රදාය සංවර්ධනය කිරිමට මැදිහත් මොවුන් වන්නේ,

චින්නයියා,
පොන්නයියා,
වඩිවේලු,
ශිවනාදම් .....
යන අයවේ. භරත නාට්‍යම් වල එන නර්තන අංග පිළිවෙලකට සකස් කිරිමේ ගෞරවය හිමිවන්නේ මොවුන්හටය.  භරත සංදර්ශනක අද තිබෙන නර්තනාංග පිළිවෙලට සැකසීමට දක්ෂ වූ මේ සිව්දෙනා පාන්ඩනලූර් පෙළපතට අයත් දක්ෂ ගුරුවරු වේ.  මේ අතර **රුක්මනිදේවි අරුන්ඩේල්, මීනාක්ෂි සුන්දරම් පිල්ලෙය්, බාල සරස්වති, ශ්‍රීමති ශාන්තා,** නර්තනයෙහි දක්ෂ ශිල්පීන් වේ.  මෙතෙක් පැවති **දාසි ආට්ටම්** නර්තනය භරත නාට්‍යම් ලෙස වඩාත් අගයක් එක් කලේ **මීනාක්ෂි සුන්දරම් පිල්ලේය**.

මෙහි ප්‍රධාන සංගීතය ලෙස දක්ෂිණ භාරතිය කර්ණාට සංගීතය  මෙහිදි භාවිතා කර ඇත.  මේ සඳහා මෘදංගය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන අතර නට්ටුවාංගම් අනෙක් තාල වාද්‍ය භාණ්ඩයද වේ. මීට අමතරව විණාව, වයලීනය, බටනළාව, තාම්පුරාව ද වාද්‍ය භාණ්ඩ වේ.


     

සංගීතඥයෝ මෙම නර්තන සම්ප්‍රදායන් වල හඳුන්වන්නේ **මුත්තුකාරන්** ලෙසය. ගීත ගායනා සඳහා ගීත ලියැවී ඇත්තේ තෙළිඟු, ද්‍රවිඩ හා සංස්කෘත භාෂාවෙනි. භරත නාට්‍යම් ගුරුවරයා හඳුන්වන්නේ **නට්ටුවනාර්** ලෙසය. මෙම නර්තන අංගය ඉගෙනිමට **අඩයාර්හි කලා කෙෂ්ත්‍රම්** ලෙස ආයතනයක් සකසා ඇති අතර නර්තනය ඉගෙනිමට මූලික ඉරියව්ව **අරමණ්ඩිය** ලෙසද හඳුන්වයි. මූලික සරඹ අභ්‍යාස අඩව් ලෙසත් තට් අඩව්, නාට් අඩව් ලෙස එය කොටස් දෙකකට බෙදා පාද හුරුකරවීමට හා අත් හුරු කරවීමට යොදා ගනු ලැබේ. මෙහි එන ප්‍රධාන නර්තන අංග වන්නේ

| | |
|---|---|
| අලාරිප්පු | පදම් |
| ජතිස්වරම් | තිල්ලානා |
| ශබ්දම් | ශ්ලෝකම් ය. |
| වර්ණම් | |

භරත නාට්‍යම් සඳහා ප්‍රධාන ඇඳුම් කට්ටලය **තුයියා සේලය** නමින් හඳුන්වයි.

| | | |
|---|---|---|
| සූරිය පිරෙයි | ජිමික්කි | කාප්පු |
| චන්ද්‍ර පිරෙයි | මාට්ටල් | ඔට්ටියානම් |
| නේත්‍ර පට්ටම් | අට්ටියල් | සලංගෙයි |
| උච්චි පට්ටම් | මූකුත්තු | වංගි |
| රාක්කුඩි | පදක්කම් | වලයල් කාප්පු |
| මිලාක්ක | කාසි මාලෙයි | නත්ති |




මීට අමතරව සාරි උඩෙයි, පිජාමා උඩෙයි, ලෙසද රංග වස්ත්‍රාභරණ කට්ටල ඇත.